**අතුරලිය ප්‍රාදේශීය සභාව - 2021**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

අතුරලිය ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට අතුරලිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1.6.1 ඡේදයේ සඳහන් (ඉ) නිරීක්ෂණය හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් ස්වරූපයේ නොවන ඉන්වෙන්ට්‍රි හා පාරිභෝජන ස්වරූපයේ උපකරණ හා ද්‍රව්‍ය වර්ග 165 කට අයත් රු.311,360 ක් වටිනා අයිතම 1080ක් ලී බඩු හා උපකරණ යටතේ ගිණුම්ගත කර තිබුණි. | ස්ථාවර වත්කම් ස්වරූපයේ නොවන ඉන්වෙන්ට්‍රි හා පරිභෝජන ස්වරූපයේ භාණ්ඩ හඳුනාගෙන ගිණුමෙන් ඉවත් කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසානයට සේවක ණය ශේෂ වල එකතුව රු.5,545,178 ක් වුවත් රු.5,247,647 ක් ලෙස රු.297,531 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | | |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු විවිධ වියදම රු.334,456 ක් වෙනුවෙන් විවිධ ණයහිමියන් යටතේ ප්‍රතිපාදන සලස්වා නොතිබුණි. | 2022 වර්ෂය සඳහා පිළියෙල කරන මූල්‍ය ප්‍රකාශනයෙන් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේදී සභාව විසින් රාජ්‍ය බැංකුවක පවත්වා ගෙන යනු ලැබූ ස්ථාවර තැන්පත් 05 ක් වෙනුවෙන් ලැබිය යුතු පොලිය රු.67,656 ක් ගිණුම්ගත කර නොතිබුණි. | | |
| (ඉ) | ඉකුත් වර්ෂයේදී තිබ්බොටුවාව හා විල්පිට මහජන පුස්තකාලවලට පරිත්‍යාග වශයෙන් ලැබුණු පොත් 63 ක වටිනාකම ගණනය කර සමාලෝචිත වර්ෂයේදී ගිණුම්ගත කර නොතිබුණි. | පොත්වල වටිනාකම පොත් ලබා දුන් ආයතන වෙතින් තහවුරු කර ගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

**1.6.2 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් එකතුව රු7,977,702ක් වූ ගිණුම් විෂයයන් 06 කට අදාල ශේෂයන් හා ඊට අදාල උපයෝගී ලේඛන/ උපලේඛනවල දැක්වෙන ශේෂ අතර එකතුව රු. 748,595 ක අසමානතා පැවතුණි. | 2022 මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව. | අදාල ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

**1.7 අනුකූල නොවීම**

**1.7.1 නිති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නිති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ.571 | වසර 02 ඉක්මවූ රු.1,617,385 ක් වටිනා ආපසු ගෙවිය යුතු තැන්පතු ශේෂ 69 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | තැන්පතු ශේෂ සම්බන්ධයෙන් පරීක්ෂා කර බලා ආදායමට ගැනීමට කටයුතු කරන බව. | රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ පුනරාවර්තන ආදායම රු.315,020 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.2,384,803 ක් විය.

**2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

**(අ) වරිපනම්**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ වරිපනම් ඒකක සංඛ්‍යාව 1538 ක් වූ අතර වර්ෂය අවසානයට වරිපනම් ඒකක 877 කින් රු.1,668,129 ක හිඟ ශේෂයක් තිබුණි. | ඉදිරියේ දී හිඟ මුදල් අය කර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකළ යුතුය. |

**(ආ) කඩකුලී**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ කඩ කාමර 23 ක් බදු දී තිබූ අතර වර්ෂය අවසානයට කඩ කාමර 11 කින් හිඟ කඩ කුලී රු.276,303 ක ශේෂයක් පැවතුණි. | හිඟ ශේෂයෙන් රු.67,925 ක් අය කර ගෙන ඇති බවත්, ඉතිරි හිඟ මුදල අය කර ගැනීමට අවශ්‍ය ලිපි ලේඛන යවා ඇති බව. | හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතුය. |

**(ඇ) සභා දේපළ බදු දීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය අවසාන වන විට සභාව සතු දේපළ 08 ක් බදු දී තිබූ අතර බදු දෙන ලද මාළු ලැලි 06 කින් රු.133,304 ක හිඟ කුලී ආදායමක් පැවතුණි. | හිඟ මුදල් අය කර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග සිදු කර ගෙන යන බව. | හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | සභා බල ප්‍රදේශය තුල පිහිටි අක්කර 03 පර්චස් 12 ක් වූ අකුරුස්ස කඹුරුපිටිය මාර්ගයේ පල්ලෙගොඩහේන නැමති ඉඩමෙහි පර්චස් 40 ක කැබැල්ල නැවත අනුබෙදුම් කිරීමේදී අංක 935/6 හා 1996 ගැසට් නිවේදය ප්‍රකාරව බිම් ප්‍රමාණයෙන් 10% ක් පොදු කටයුතු සඳහා ලබා දිය යුතු වුවද සභාවට හිමි විය යුතු ඉඩම් කොටස නිසි පරිදි පවරා ගෙන අදාල පොදු කාර්යයන් සඳහා යොදාවා ගැනීමට සමාලෝචිත වර්ෂයේදීද ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | 10% කොටස ලබා දීමට නැවත සිහි කැඳවීමේ ලිපි මගින් දැනුම් දුන් බවත්, ඒ පිළිබඳව ක්‍රියාත්මක නොවන්නේ නම් අයිතිකරුට එරෙහිව නීත්‍යානුකූලව ක්‍රියා කිරීමට කටයුතු කරන බව. | ගැසට් නිවේදනය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2020 ඔක්තෝබර් 19 දින අංක BA/AT/12/2020 දරන ගොඩනැඟිලි අයදුම් පත්‍රය සඳහා සංවර්ධන බලපත්‍රය 2020 ඔක්තෝබර් 19 දින නිකුත් කර තිබූ නමුත් අනුමත සැලසුම් අනුව මහල් දෙකකින් යුත් ගොඩනැඟිල්ලක් සඳහා කොන්ක්‍රීට් තට්ටුව යොදා ඉදිකළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 13 දින ක්ෂේත්‍ර විගණන පරීක්ෂාවේදී අනුමත සැලැස්මට අනුකූල නොවන පරිදි මහල් 03 කින් ගොඩනැඟිල්ල ඉදිකර තිබූ අතර රථවාහන නැවැත්වීම සඳහා වෙන් කළ යුතු ඉඩ ප්‍රමාණය වෙන් කර නොතිබුණි. | අනවසරයෙන් ඉදිකළ කොටසට අදාල සේවා ගාස්තු ගෙවා අනුමත කරගන්නා ලෙස මෙම ගොඩනැගිලි අයදුම්පත්‍රයේ හිමිකරුට දැනුම් දී ඇති බව. | නිසි සංවර්ධන බලපත්‍රයකින් තොරව සිදු කරන ඉදිකිරීම් විධිමත් කිරීමට හෝ ඉවත් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | විවිධ හේතුමත අනුමත කිරීම ප්‍රතික්ෂේප කරන ලද ගොඩනැඟිලි අයදුම්පත්වලට අදාල ඉදිකිරීම් 03 ක ගොඩනැඟිලි ඉදිකර අවසන් කර හෝ ඉදිවෙමින් පැවති අතර සංවර්ධන බලපත්‍ර ලබා ගැනීමෙන් තොරව ගොඩනැගිලි 02 ක් ඉදිකර තිබුණි. මෙම ඉදිකිරීම සම්බන්ධයෙන් නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් හා සංවර්ධන නියෝග / රෙගුලාසි අතුලත් 2021 ජූලි 08 දිනැති අංක 2235/54 දරන ගැසට් නිවේදනයේ 02 වන උපලේඛනය ප්‍රකාරව කටයුතු කර රු.509,914 ක ගාස්තු අයකර විධිමත් කිරීමට හෝ ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. | අනවසර ඉදිකිරීම් විධිමත් කර ගන්නා ලෙස දැනුවත් කළ බවත්, විධිමත් කර ගැනීමට කටයුතු නොකරන්නේ නම් ඉදිරියේදී නීත්‍යානුකූලව කටයුතු කර අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමට කටයුතු කරන බව. | ගැසට් නිවේදනය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |